# ශක්තිය

පොදු ජන හඬේ දෝංකාරය

## යු.ඇන්.පී.යේ සමුළුව දෙදරයි.
## නායක ගැටුම් මතුවේ.
## ජ.වි.පෙ. සමග සජිත් එළියට ?.


තැපැල් කාර්යාලයේ ලියාපද්ංචි කරන ලදි : QD/05/NEWS/2019

වෙළුම : 17 කලාපය : 06 අන්තර්ජාල ලිපිනය - www.shakthiya.org 2019 ජූලි /අගෝස්තු මිල රුපියල් 30.00යි.


# ජනාධිපතිවරණය 2019
# UNP පරාජය නියතයි...
# මැතිවරණ වැළැක්වීමේ කුමන්ත්‍රණයක්?



මහ බැංකු කොල්ලය ඇතුළු රාජ්‍ය බලය සහිත දුෂණය, රාජ්‍ය සම්පත් කොල්ලය, ඇමරිකාව සමග අත්සන් කරන ගිවිසුම් හරහා දේශයේ ස්වෛරීභාවය අහිමි කිරීම, ණය බරින් හෙම්බත්වූ ගැමි ගොවි විරෝධය, ජාතික ආරක්ෂාව අහිමි කිරීම, ජනවාර්ගික එක්සත් කම ඇතිකළ නොහැකි වීම හා ඉරිදා පාස්කු ප්‍රහාරයට පසු රටේ ඇතිවී තිබෙන අරාජික බව හේතුකොටගෙන ඉදිරියේ පවත්වන ඕනෑම මැතිවරණයකදී UNP යේ පරාජය නියත බව සියලු බුද්ධි අංශ රජයට දැනුම්දී ඇතිබව වාර්තා වේ.

මේ අතර සජිත් රනිල් ගැටුම එළිපිටට පැමිනීමත් සමග යු.එන්.පී. තුල අර්බුදය තවදුරටත් අග්‍රවී ඇත.

රජයේ විවිධ ආරක්ෂක හා බුද්ධි අංශ පාස්කු ප්‍රහාරය පිලිබදව කල්තියාම ආණ්ඩුවේ වගකිවයුතු පුද්ගලයන්ට දැනුම්දී තිබියදී එය තුට්ටුවකට නොසලකා හරිමින්, ව්‍යවස්ථා දායකය හා විධායකය ආරක්ෂක මණ්ඩලයට නොකැඳවා කටයුතු කිරීම මගින්, අහිංසක ජීවිත 300 කට ආසන්න ප්‍රමාණයක් රටට අහිමි වූයේ හිතුවක්කාර දඩබ්බර ප්‍රතිපත්තියක් හා කොන්දක් නැති නායකයන් නිසා බවට අගරදගුරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් කල ප්‍රකාශය මගින් ආණ්ඩුවේ අස්ථාවර බව හා නොහැකියාව මුළු ලොවටම පෙන්වා දී ඇතැයි දේශපාලන විචාරකයන්ගේ මතය වේ.

තවදුරටත් අදහස් දැක්වූ අගරදගුරු තුමා ප්‍රහාරයෙන් පසු යොදන ලද උප්පරවැට්ටි නිසා කම්ටු වාර්ථා පිළිගත නොහැකි වන බවත්, ප්‍රතිපත්තියක් නැති නායකයන් ගෙදර යවා පුළුවන් නායකයෙකුට රට බාරදෙන ලෙසත් එතුමා ප්‍රකාශ කළේය.

මේ අතර පාස්කු ප්‍රහාරයට කලින් හෙලිදරව් කරගන සිටි පුද්ගලයන් අත්අඩංගුවට නොගැනිම ගැන උරණවූ ජනපති පොලිස්පති ඉවත්කරන ලෙසට කල දැනුම්දීම නොසලකා රනිල් වික්‍රමසිංහ විසින් පොලිස්පති ඉවත්කිරීම වැලක්වීම හේතුවෙන් ඔහු අනිවාර්ය නිවාඩු යැවීමට සිදුවූ බව ජනාධිපති පැවසීය.

චීනය ආසියා-පැසිපික් කලාපයේ පමණක් නොව ලෝකයේම බලවතා බවට වේගයෙන් පැමිණීම හේතුවෙන් එය වලකාලීම ඇමරිකාවේ අභිලාශය වී තිබේ. මේ අන්තර් ජාතික බල අරගල පසුබිම තුල ඇමරිකාව තම භූ දේශපාලනික උපායමාර්ග ක්‍රියාත්මක කරන රටක් ලෙස ශ්‍රී ලංකාව තෝරගන ඇති බව සමාජවාදී ජනතා පෙරමුණේ නායකයන් පසුගියදා, පිටකොටුවේ පැවතී උද්ගෝෂනයේදී පැවසීය.

මේ අනුව පාස්කු ප්‍රහාරය යොදාගෙන ශ්‍රී ලංකාව තුල ජනවාර්ගික කෝලාහලයක් අවුලුවා (83 කළුජූලිය මෙන්) රටට කඩාවැදී රට අස්ථාවර කර ඊනියා ත්‍රස්තවාදය පරාජය කිරීමේ නාමයෙන් සියලුම මැතිවරණ කල්දමා ප්‍රතිත්‍රස්ත පනත, ඉඩම් පනත, වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී පණත් පනවා ඊට වෙරෙහිවන ජනතා ක්‍රියාකාරීත්වයන් මර්ධනය කර පොලිස් රාජ්‍යයක් වෙත රට ගෙනයාම රනිල්ගේ උපාය අකුලාගැනීමට සිදුවූ බව දේශපාලන විචාරක මතයයි.

**සරත් රණසිංහ**

## රාජිත බේරාගැනීමේ යු.එන්.පී මෙහෙයුම

සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්නට එරෙහිව ඇති චෝදනා පිළිබදව පාර්ලිමේන්තු විවාදයකට ගැනීමට නියමිත දිනයේ යු. එන්. පී. ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුව මගහරිමින් අවම ගණපූර්ණය නොසිටින ලෙස තම චූදිත සගයා බේරාගැනීමට

එකාවන්ව දැරූ උත්සහය අතීසාරයට අමුඩ ගැසීමක් වැනියැයි දේශපාලන විචාරකයෝ පවසති.ඔවුන් වැඩිදුරටත්

කියාසිටියේ යු. ඒන්. පී. ආණ්ඩුවේ දුෂිත බව මෙයින් ඔප්පුකර පෙන්වීමක් වන බවය.

**දර්ශන රණසිංහ**

### ලැන්ටි

යු.ඇන්.පී.යේ නායකත්වය හා පක්ෂය අතර ගැටුම්

- ප්‍රවෘතියක්



අනේ අපොයි...
බැංකු කඩන්න, රට විකුනන්න, සහරාන්ලා හදන්න නායකය වෙන්න දගලනවා වෙන්න ඇති

- ලැන්ටි

## එංගලන්තයෙන් ලංකාවට කසල ටොන් 27000ක්

කටුනායක ආයොජන කලාපයේ දැනට තිබෙන කසල ප්‍රමාණය ටොන් 300ක් නොව 27000ක් බව වාර්ථාවේ. ඒ අනුව එක කන්ටේනරයක ගෙන ඒමට හැකි ටොන් 27ක් පමණ කසල කන්ටේනර් 1000ක තොගයක් ලංකාවට ගෙනවිත් තිබේ. මේ ගැන පරීක්ෂණ නිසි අයුරින් සිදු කල හොත් එම ජාතික අපරාධයේ නියම වැරදිකරුවන් හසුවනු නියතය.

ශක්තිය
— පොදු ජන හඬේ දෝංකාරය —

49/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස්/ දුරකථන: 0112684820
විද්‍යුත් තැපැල: Shakthiya85@gmail.com
වෙබ් අඩවිය: www.shakthiya.org

# බෘෘටස් පිලිවෙතේ පාද සටන

පසුගිය ජූලි 07දා ජ.වි.පෙ. ලේකම් ටිල්වින්ගේ ගමින් ඇරඹූ ''වීදි පිරෙන පාද සටන'' කෙලවර වූයේ වඳ පීදුනු අවසානයකිනි.

ජනතාවට එරෙහි සටන් මගින් ලේ වැකි අඳුරු ඉතිහාසයක වාර්තා තබා ඇති ජ.වි.පෙ.ය මෙවර වීදි පිරෙන ''පාද සටන්'' රංගනයක් නිරූපනය කලේය. පෙත්සම්, පත්‍රිකා, පිකටිං, උද්ඝෝෂණ, පාගමන්, සත්‍යග්‍රහ, වීදි සටන්, හර්තාල්, මහ වැඩවර්ජන ආදි ජනතා අරගල සටන් අත්දැකීම් උරුම ලාංකික දේශපාලනයේ සටන්කාමීන්ට ජ.වි.පෙ. විගඩම් දේශපාලනය ගැන දැනෙන්නේ මහත් අපුලකි.

2015 සිට අධිරාජ්‍යවාදී නව ලිබරල්වාදය වෙනුවෙන් ගොඩනැගුනු යූ.ඇන්.පී., ශ්‍රී ල.නි.ප., දෙමළ ජාතික සන්ධානය හා මුස්ලිම් කොන්ග්‍රස් දෙක එක්වූ අන්ත දක්ෂිනාංශික පෙරමුණට ජ.වි.පෙ.ය ඇලීගැලී ඇතුලත්ව ජනතාවගේ ආර්ථික යැපීමත්, ප්‍රජාතන්ත්‍රයත්, ජාතික ස්වාධීනත්වයත් විනාශ කරනු ලැබීය. එම පාපකර්මයෙන් මිදීමට පයින් ගෑටීම ප්‍රමාණවත් නොවන අතර හම්බන්තොට සිට කොළඹ දක්වා කටු ගසාගෙන ජනතාවට වඳිමින් සමාව ඉල්ලා ගිණි අව්වේ තාරපාරේ පෙරලි පෙරලී ගමන් කළ යුතුව ඇත.

මහින්ද රජය පරාජය කිරීම සඳහා යහපාලන සභාගය වෙනුවෙන් ජනාධිපතිවරණයට යූ.ඇන්.පිය සමඟ එක්ව බොරු කථා රටපුරා පතුරවා පොදු අපේක්ෂකයා වෙනුවෙන් ජනතාවගෙන් තීරණාත්මක ඡන්දයක් කොල්ල කා දුන්නේය. ඉන්පසු රනිල්-මෛත්‍රී ආණ්ඩුවේ මූල්‍ය අපරාධ කොට්ඨාශයේ ගෝනිබිල්ලෙක් වී තම විරුද්ධවාදීන් හිරගත කිරීමට අලුගෝසුවන් ලෙස ක්‍රියා කලේය.

පළාත් පාලන සටනින් ආන්ඩු විරෝධී බලවේග විශිෂ්ඨ ජයක් අත්පත් කර ගනිමින් යූ.ඇන්.පි.ය පමණක් නොව ජ.වි.පෙ.ද කුජීත ලෙස පරාජය කලේය. එහි අනුහසින් සිරිසේන - රනිල් සභාග දීගය දෙපලු වී ගියේය. එහෙත් ජ.වි.පෙ. රනිල් ඇතුලු අනෙකුත් දක්ෂිනාංශිකයින්ගේ ජනතා විරෝධී ක්‍රියාමාර්ග තවදුරටත් එකට ගොනුවිය. රනිල්ගේ උවමනාව අනුව පළාත් සභා මැතිවරණ කල් දැමීමේ යෝජනාව ස්ථිර කර දුන්නේ ජ.වි.පෙ. මන්ත්‍රීවරුන් හය දෙනාගේ ඡන්දයෙන්ය.

ජනපති සිරිසේන වඩාත් ජනතාවාදී මාවතකට හැරෙමින් මහබැංකු කොල්ලකරුවන්ගෙන් ඈත්වෙමින් ඒකාබද්ධ විපක්ෂය දෙසට නැඹුරු වී නව ආණ්ඩුවක් පිහිටුවීමට ඉඩකඩ විවර කලේය. පසුගිය ඔක්තෝබර් 26 දින ආණ්ඩු පෙරලියෙන් අගමැති තනතුර මහින්ද මැතිතුමාට පවරා දීම සිදු වූයේ ඒ අනුවය. එයින් පරල වූ ජ.වි.පෙ.ය රනිල්ගේ අගමැතිකම රැකදීම වෙනුවෙන් බටහිර තානාපති කාර්යාල පසුපසත්, අරලියගහ මැදුරේත් නිදිවරාගෙන කාලය ගතකරමින් රටට විරුද්ධ විදේශ බලවේග සමඟ එක්වී මහ මැතිවරණයකට ගමන් කිරීමේ මාවතද වලකා පාර්ලිමේන්තුවේ දක්ෂිනාංශික බලය තහවුරු කර දීමටද බැලමෙහෙවර ඉටු කලේය.

සහරාන්ගේ මරාගෙන මැරෙන කල්ලියේ සහකරුවෙක් වූ ඊබ්රාහිම් නැමති ජ.වි.පෙ. පාක්ෂිකයා පක්ෂයට ලබා දුන් මුදල්වල තඹ හා කුලුබඩු සුවඳ පමණක් නොව දේශයේ පාසල් දරුවන්ගේ ආත්මය බිලිගත් මත්කුඩු දුම්රොටු දුඟදද තැවරී ඇති බවට සැකපහල වී ඇති බව නායකයින් නොදන්නවාද? එසේ තිබියදී ජ.වි.පෙ. මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ ඒ පිලිබඳ කාරක සභාවේ සභිකයෙක්ද වී ජනතාවගේ ඇස්වලට වැලිගැසීමට සැරසීම රටම හිනස්වන විහිලුවකි.

යූ.ඇන්.පී. ආණ්ඩුවේ අවසන් ගමන් නියතවී තිබේ. නමුත් යූ.ඇන්.පී.ආණ්ඩුව තවමත් රැදී සිටින්නේ ඡන්ද මඟහැරීමෙන්ය. එබැවින් ගිලෙන නැවෙන් පනින මීයන් ලෙස ජ.වි.පෙ. දැන් මීලඟ මැතිවරණ වලදී තමන්ගේ ඉස්පාසුව රැක ගැනීමට ''සටන්'' නාමයෙන් නරිනාටක රඟයි. ආණ්ඩුවට විරුද්ධව ජ.වි.පෙ. ගෙන එනු ලැබූ විශ්වාසභංගය පරාජයවීම ගැනද මහින්දගේ සහ විපක්ෂයේ පාර්ශවයට දෝෂාරෝපනයට දොස් තබති. ජ.වි.පෙ. සමඟ එකගෙයි කෑ දෙමල ජාතික සන්ධානය හා මුස්ලිම් පක්ෂ ගැන කිසිවක් නොකියති. අවසාන වශයෙන් ඔවුන්ගේ විශ්වාසභංගයද ඉවහල් වූයේ නැවතත් යූ.ඇන්.පී. ආණ්ඩුව තහවුරු කිරීමේ දිසාවෙනි.

දශක හතරක් තිස්සේ ජනතා සටන් වමේ කෝනයෙන් පාවාදීමේ නිපුනතාවක් ලබා ගත් ජ.වි.පෙ.ට මෙවරද දක්ෂිනාංකයින් සමඟ දීගකෑම ගැන ඔවුන්ගේ පහල සාමාජිකයින්ගෙන් බරපතල විවේචනයක් එල්ල වෙමින් ඇති හෙයින් ඊට මුහුණ දීමට නාකි දනගාන සටන් මෙහෙයුමක් දියත් කර ඇත. ඉතිහාසය පුරා මෙතෙක් සිදු කළ ආකාරයට මොවුන්ගේ මුඛ්‍ය අරමුණ වන්නේ මෙවරත් නැඟ එන ආණ්ඩු විරෝධී සටන් රැල්ලේ ඉදිරියට පැමිණෙන නායකත්වයට පසුපසින් සිට පිහියෙන් ඇනීමේ බෘෘටස් පිලිවෙත ක්‍රියාවට නැංවීම බව නව පරපුර තේරුම් ගත යුතුය.

# ජනතා නැගිටීම් ඉදිරියේ ලෝක අධිරාජ්‍යවාදය වියරු වැටේ



ලෝක අධිරාජ්‍යවාදීන්ගේ පීඩනය හමුවේ ලොව පුරා ජනතාව නැගිටිමින් ප්‍රතික්‍රියා දක්වයි. මෙම නැගිටීම් වැඩකරන ජනතාවගේ විරෝධතා ලෙස පමණක් නොව විවිධ සමාජ දේශපාලන ආර්ථික බලමුලු එක්වෙමින් ලෝකය ගමන් කළ යුතු දිසාව පිලිබඳ තියුණු විවේචනයන් හා බාධක පමුණවමින් සිටී.

විශේෂයෙන් මෙහිදී බටහිර ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ මතු වී ඇති ගැටුම ප්‍රංශය තුලත්, ස්පාඤ්ඤයේ වාම නැඹුරුවෙනුත් පෙන්නුම් කරයි. එහිදී විද්වතුන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ ආයතනයන් ඔස්සේ ගෝලීය උනුසුම, පරිසරය රැක ගැනීම මෙන්ම සමාජ ආරක්ෂණය පිලිබඳව නව ලෝක සම්මුතීන් ඇති කර ගැනීමට වෙහෙසීමද දැකිය හැකිය.

අධිරාජ්‍යවාදී ලෝකයේ වඩාත් ලාභදායී ව්‍යාපාරය වී ඇත්තේ ආයුධ නිෂ්පාදනය හා වෙළඳාමයි. මෙහි ප්‍රමුඛයා ලෙස කටයුතු කරන ඇමරිකාව රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් ඔස්සේ යුද්ධ නිර්මානය කිරීමද ලෝක ත්‍රස්තවාදය නඩත්තු කර ගැනීම වෙනුවෙන් විවිධ ආයෝජනයන් සිදු කිරීමද සිදු කරමින් ඇත. ඒ සඳහා රාජ්‍ය තාන්ත්‍රික උපක්‍රම පාවිච්චි කරන අතර ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකාරයෙන් පාලනයන් මාරු කිරීමේ තීන්දු වොෂින්ටන් මුල් කර ගනිමින් ඇත. එයට ප්‍රතික්‍රියා ලෙස ජාතික රාජ්‍යන් තුල ගොනුවීම් ද පැන නඟිමින් ඇත. මේවා තුලනයවීම් සිදුවන්නේ රුසියානු - හා චීන මැදිහත්වීම් ඔස්සේය.

නොයෙකුත් හේතු දක්වමින් ඇමරිකාව ගෙනයනු ලබන ස්වෝත්තමවාදී ක්‍රියාමාර්ග ඔස්සේ වෙළඳ තහංචි පණවමින් ගෝලීයකරන ක්‍රියාදාමය අඩපන කිරීම සිදු කරයි. මෙයින් බටහිර රටවලට වාසිදායකව සකසා තිබෙන ජාත්‍යන්තර වෙළඳාමද අඩ පන කරන බැවින් ඇතැම් රටවල් ඇමරිකානු ක්‍රියාමාර්ග නොතකා කටයුතු කිරීමද දැකිය හැකි ලක්ෂණයකි. පසුගිය දිනවල චීනයේ ආනයනයන්ට විරුද්ධව ඇමරිකාව පැනවූ බදු නිසා එයට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් ලෙස චීනයද ඇමරිකාවෙන් ගෙන එනු ලබන ආනයන බවදු වැඩි කිරීමත්, අත්‍යාවශ්‍ය ලෝහ වර්ග ඇමරිකාවට අපනයනය නැවැත්වීමත් නිසා ආයුධ කර්මාන්තයේ නියුතු සමාගම්වල නිෂ්පාදනය හා ලාභය බිඳවැටීම ආරම්භවීමත් සමඟ ඇමරිකානු තහංචි ඉවත් කර ගැනීමට ඔවුන්ටම සිදු විය.

මීට අමතරව ඉරානයේ න්‍යෂ්ටික ගිවිසුමෙන් ඇමරිකාව ඉවත්වී ඒකපාක්ෂිකව සම්බාධක පැනවීම මගින් ඉරානයේ ස්වාධීනත්වය යටපත් කිරීමට දරණ ලද ප්‍රයත්නය නිසා දැඩි ආර්ථික පීඩනයක් හා නොසංසුංතාවයන්ද මතුවී තිබේ. ඉරානයේ තෙල් අපනයන නෞකාවක් බ්‍රිතාන්‍ය විසින් අත්අඩංගුවට ගැනීම හා එයට එකට එක කිරීමක් ලෙස හෝමුස් සමුද්‍ර සන්ධිය අසලදී ඉරානය විසින් බ්‍රිතාන්‍ය නැවක් අත්අඩංගුවේ තබා ගැනීමත් මධ්‍ය ධරනී මුහුදු කලාපයේ යුද්ධ උනුසුම් තත්වයක් මතු කරමින් තිබේ. එම කරුන මත යුරෝපා රාජ්‍යයන්ද බෙදෙමින් තීරණ ගනිමින් ඇත.



# යහපාලනය දෙදරයි - යූ.ඇන්.පී.ය පුපුරයි - පොදු ජන යුගයක හැඩරුවක්

**පොසොන් සඳ රැස් සමඟ රටපුරා හමාගිය දැඩි සුලං දහරාව නිසා ස්ථාන ගණනාවක අනතුරු හා ජීවිත හානි සිදු විය. මුහුදු ගිය ධීවරයන් අතරමංව අවට රටවල් මැදිහත්වීමෙන් ජීවිත ගලවා ගත් තොරතුරු ලැබුනි. ඉහල කඳුකරය තෙත් කරමින් ඇද හැලුනු ධාරානිපාත වර්ෂාව නිසා ජලාශ උතුරා යමින් වාන් දොරටු හැරදැමුනි. දේශපාලන බිමේද දැඩි කුණාටුවක ලක්ෂණ පෙන්නුම් කරන්නට විය. ජනාධිපති අපේක්ෂකයා කවුද යන්න හැමගේ මුවග රැව් දෙන වදනක් බවට පත් විය. ඒකාබද්ධ පොදු ජන පෙරමුනේ අපේක්ෂකයා පිලිබඳ තීන්දුව ඉතා ඉක්මණින් ප්‍රකාශයට පත් වන අතර, යූ.ඇන්.පි.ය තුල අපේක්ෂකයා තෝරා ගැනීම මහ පාරේ ගැටුමක් ඇති කර ගන්නා බවක් පෙනෙන්නට තිබේ.**

## ජනතාවට නියත ජයක්

සියලු දිසාවන්ගෙන් ලැබෙන තොරතුරු හා බුද්ධි වාර්තාවන් අනුව විපක්ෂය ඉදිරියෙන් සිටීම ජාත්‍යන්තර බලවේගවලට දැනේ. බහුතර ජනතාවගේ යූ.ඇන්.පි. විරෝධී කෝපය ඉහල යෑම පිලිබඳව බටහිර තානාපති කාර්යාල මගින් ඔවුන්ගේ මව් රටවලට දන්වා තිබේ. ඒ අනුව මෙතෙක් රනිල්ගේ නායකත්වය මුල් කර ලැබුණු උපදෙස් වෙනස් කර විපක්ෂ බලවේග මෙහෙවන මහින්ද හිටපු ජනපති සමඟ සම්බන්ධතා දැඩි කර ගැනීමේ උත්සාහයන්ද ඇමරිකානු තානාපතිවරියගේ හැසිරීම්වලින් පෙනෙන්නට තිබේ.එසේම බ්‍රිතාන්‍ය තානාපතිවරයාද සිවුපස සිවුරු රැගෙන යමින් අස්ගිරි මහනා හිමිවරුන් බැහැ දකිමින් මාක්ස්ගේ වකවානුවේ සිට පැවති අයිරිෂ්වරුන්ට විරුද්ධව බ්‍රිතාන්‍යගෙන ගිය අරගලය ද මතක් කරදී ලංකාවේ සංහිදියා ක්‍රියාදාමයට සහය දක්වන බවද ප්‍රකාශ කර ඇත.

## පොහොට්ටුවේ විකසිතවීම

ශ්‍රී ල.නි.ප. පුපුරා යාම වම - දකුණ බෙදීමක් ලෙස පෙනුනත් එයින් මතුවන යථාර්ථය ඊට වඩා ගැඹුරුය. විශේෂයෙන් අධිකාරිවාදී ජේ.ආර්.ගේ ව්‍යවස්ථාවට මුවාවී හිස් උදුම්මා ගෙන, ශ්‍රී ල.නි.ප.ය හා ජනතාව අතර පැවති බැඳීම දෙබෑ කරමින් බටහිර කුමන්ත්‍රණකරුවන්ගේ උපකාර ලබන පිරිසක් බවට එක් කොටසක් පත්විය. අනෙත් අතින් වාමාංශිකයින් හා ප්‍රගතිශීලීන් එක්වී නැවතත් පොදු ජන නායකයා වූ මහින්ද යෝධයෙක් ලෙස නඟා සිටුවීමේ දැවැන්ත කර්තව්‍යයට සියලු ආණ්ඩු විරෝධීන්ගේ සහය පලවිය. නව ලිබරල්වාදයේ දරුනු සැඩසුලඟ ආසියාව හා හමායාමත් සමඟ ඉන්දියාවේ කොන්ග්‍රස් නායකත්වය ඇඹරී ගියේය. වාමාංශිකයින් පරාජයට පත්වූ අතර, ආගමිකවාදී, ජාතිකවාදී පිරිස් නැවතත් ප්‍රජාතන්ත්‍රවාදීන් ලෙස අභිෂේක ලැබුවේය.

## යකඩ පූට්ටුවේ තව් ගැලවීයාම

මහින්ද වටා පෙල ගැනුසු ඒකාබද්ධ විපක්ෂය ක්‍රමාණුකූලව ආණ්ඩු විරෝධී ජනතාව පෙලගැස්වීමත් සමඟ පළාත් පාලන ඡන්දය දිනා ගැනීමට මඟ පෑදුනු අතර එතෙක් පැවති සිරිසේන-රනිල් යකඩ පූට්ටුවේ වෙල්ඩිං තව් ගැලවී ගියේය. ආණ්ඩු පක්ෂයේ මැතිඇමතිවරු තනතුරු අතහරිමින් ඒකාබද්ධ විපක්ෂයට එක්විය. ඒ සියල්ලේ බලපෑම මත සිරිසේන ජනපති අතින් මහින්ද මහතාට ආණ්ඩුවක් පිහිටුවීමේ වරමක්ද හිමිකර දුන්නේය. එහෙත් අතට ලැබුණු බලය රඳවා ගැනීමට විපක්ෂ බලවේග අසමත් වූයේ කුමන හේතුවක් නිසාද යන්න මේ වන විට පැහැදිලිවී තිබේ. ආණ්ඩු විරෝධී බලවේගයේ ප්‍රධාන දහරාව පොහොට්ටුව නමින් සංවිධානයවීම ඇරඹීමත් සමඟ එතෙක් පැමිණි ගමන් මඟ බලය ලබා ගැනීමටත් පෙර ඔවුන්ට අමතක වී ගියේය. පසේ බුදු න්‍යායෙන් තමන් පමණක් එතරවීමේ භාග්‍ය උදාකර ගැනීමේ ගිජුකම නැවතත් නිලධාරින්ට හා තරුණ සංවිධායකයින්ට මතුවීමේ අවලක්ෂණය මහින්ද මහතා ඇතුලු ඒකාබද්ධ විපක්ෂයේ ප්‍රබුද්ධ නායකයින් පිටු දැක ඇත. කල් පමා වෙමින් පැවති නව සන්ධානය ඒකාබද්ධ පොදු ජන පෙරමුණ ලෙස ප්‍රකාශයට පත් කර ඉදිරි ඡන්ද මෙහෙයවීමට තීරණයවීම පොදු ජනතා ජයග්‍රහණයේ සංඛේතයක් බවට පත් වෙමින් තිබේ.

## ප්‍රතිපත්ති ප්‍රකාහයද? සංවිධාන ජාල වැඩපිලිවෙලද?

සිරිසේන ජනපති කොන්කර තමන්ට තනි බලයක් ලබා ගත හැකිය යන මිත්‍යාව වැපිරවීමේ කොන්තර දේශපාලන අවසන් කළ යුතුය. පොහොට්ටුව හා ශ්‍රී ල.නි.ප. සමඟ පැවති සාකච්ඡාවන් අසාර්ථක වී ඇත්තේ ඔවුන් ජනතාවගේ සුබසිද්ධියට වඩා තම නායකයින්ගේ බලතල බෙදා ගැනීමට ගැන උනන්දු වූ බැවිනි. එනිසා සිරිසේන ජනාධිපතිගේ පිරිස්ද ඒකාබද්ධ විපක්ෂයේ ජනාධිපති අපේක්ෂකයාට සහය පලකරවා ගැනීම ගැන සාකච්ඡා පොහොට්ටු පක්ෂය මගින් තනිව කළ නොහැකිය. ඒ සඳහා ඒකාබද්ධ විපක්ෂයේ අත්දැකීම් ඇති නායකයින්ගේ මැදිහත්වීම අත්‍යවශ්‍යව පවතී. මෙහිදී ප්‍රතිපත්ති ප්‍රකාශය එලිදැක්වීම අතපසු කරමින් සංවිධාන ජාලය ශක්තිමත් කිරීම ගැන කෙරෙන නිලධාරි කථා කෙලවර වන්නේ ජයග්‍රහනයෙන් පසුව ජනතාවගේ උවමනාවන් අතහැර නව ලිබරල්වාදයට යටත්වීමය.
එබැවින් ජනතා බලවේග වැඩපිලිවෙලක් තුල පෙල ගස්වා ගෙන ජයග්‍රහනයේ ශක්තිය හා බලය ජනතාව අතට ලබාදීම පක්ෂ නිලධාරින් තනතුරු බෙදාහදා ගැනීමේ අරගලයකට වඩා වැදගත්ය. එය මහින්ද මහතා ඇතුළු ඒකාබද්ධ විපක්ෂයේ ප්‍රබුද්ධ නායකයින්ට භාර වෙන සුවිශේෂ දේශපාලන කර්තව්‍යක් ලෙස සිහිතබා ගත යුතුය.

## අධිරාජ්‍යවාදීන් සමඟ එක්වූ ජනවාර්ගික සංහිදියාවක්

නව ලිබරල්වාදය පැතිර යමින් පවතින යුගයේ ප්‍රමුඛ ලක්ෂණය වන්නේ ධනපතියන් අධිරාජ්‍යවාදීන් සමඟ එක්වෙමින් බහුජාතික සමාජ ජාලයේ පිහිටාධාරයෙන් පොදු ජනතාවගේ සම්පත් කොල්ලකෑම හා ඔවුන්ගේ වත්කම් ඉඩකඩම් දේපොලන අත්පත් කර ගැනීමය. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ වැඩකටයුතුද සිදු කිරීමට වන්නේ වාමාංශිකයින්, ප්‍රගතිශීලීන්, ප්‍රජාතන්ත්‍රවාදීන්, පරිසරවාදීන් ජනවාර්ගිකයින් හා කාන්තාවාදිනියන් එක් වූ පුලුල් සන්ධානයකිනි. මේ බව ලංකාවේ පසුගිය දශකය තුල වර්ධනය වූ දේශපාලනයෙන් පෙන්නුම් කරයි

සමහරුන් කල්පනා කලේ ධනපති පක්ෂ එක්වී ජනවාර්ගික සංහිදියාවක් ඇති කර ප්‍රජාතන්ත්‍රය ස්ථාපිත කිරීම රනිල්ගේ නායකත්වයෙන් කළ හැකි බවය. . එම ධනපති පෙරමුනේ රනිල් අධිරාජ්‍යවාදීන්ගේ ඒජන්තයාය. ශ්‍රී ල.නි.ප. පාලනයේ හවුල්කරුවාය, දෙමල ජාතික සන්ධානය හා මුස්ලිම් පක්ෂ දෙක අධිරාජ්‍යවාදීන්ගේ පිහිටෙන් තමන්ගේ පිඟන් පුරවා ගනිමින් වාමාංශික නමින් පෙනී සිටි ජ.වි.පෙ. අලිපැටව් ටිකද දෙනදේ බුදිමින්, කුංචනාද කරමින්, මලමුත්‍රා වපුරමින්, පසුගිය සිව් වසරක පාලනයේ නැටූ නාඩගම් ජනතාවට මතකය.
මොවුන් එක්වූ පලමු දිනයේදීම කලේ මහබැංකුවේ දේපොල කොල්ල කෑමය. ඉන්පසුව විදේශිකයින්ට දේපොල විකිනීමය, එයින් පසුව දිනෙන් දින ගොවියන්ගේ, පොදු ජනතාවගේ ඉඩකඩම් කුනුකොල්ලයට විකිනී යන ලෙස නීතිරීති අනපනත් වෙනස් කිරීමය. අවසානයේ සමාජය පතුලෙන් අධිරාජ්‍යවාධයේ ආශිර්වාදයෙන් මතුවූ අන්තවාදී සහරාන්ලගේ රුදුරු ත්‍රස්තවාදයට අහිංසක පුරවැසියන් බිලි දෙමින් පාලකයින් හා නිලධාරින් එකිනෙකාට ඇගිලි දික් කරමින් පාර්ලිමේන්තුවත් අධිකරණයක් විහිලුවට ලක් කිරීමය. මේ බව ඉතාමත් සරල බසින් ජනතාව දැනුවත් කළ අගරදගුරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපානන්ගේ උත්සාහයෙන් වාර්ගික කලකොලාහලයක් සිදු නොවීම නිසා විදේශ හමුදාවන්ට රටට ඇතුලුවීම වැලකී ගියේය.

## යූ.ඇන්.පී.යේ පුපුරායාම

රනිල් සියලු අතින් අසාර්ථක විදේශික සෘජු ඒජන්තයෙක් බව පක්ෂය තුලින්ම රටට හෙලිවී හමාරය. ඔහුගේ නායකත්වය පිරිහීයමින් ඇති අතර, සජිත්-කරු-රවි පොර කුකුලන් මෙන් එකිනෙකා කා කොටා ගනිමින් ඇත. ඒ අතර චම්පික - රාජිත හා ජ.වි.පෙ. හබන් කුකුලන්ද කැකුන අහුලා කමින් සිටී. මොවුන් අතර උත්සන්න වෙමින් පවතින ගැටුම නුදුරේම පාරට පැමිනීම අපේක්ෂා කළ යුතුය.
එදා ජේ.ආර්. පරාජය කර ප්‍රේමදාස බලයට පැමිනීමට හේතුවූයේ ජ.වි.පෙ. කැරැල්ලය. මෙදා රනිල් පරාජය කර සජිත්ට බලය ලබා ගැනීමට සහරාන්ගේ බෝම්බයේ පුපුරායෑමේ දුම්රොටු ප්‍රමාණවත් නැත. එනිසා බොහෝ විට ඔහු පසුපසට තල්ලු වී කරු වැනි අධිරාජ්‍යවාදීන්ට අවනත අයෙක් මතු කර ගැනීම සිදු විය හැකිය. එවැනි අවස්ථාවකදී බොහෝ විට සිදු වන්නේ දුර්මුඛවන සජිත් පාක්ෂිකයින් හා ඔහුගේ වංශ බලවේගයන් මහින්දගේ උද්ඝෝෂණය දෙසට ඇදීයාමය. එබැවින් මේ දිනවල සජිත් ලනුව කඩාගත් මීමෙක් ලෙස වලං බිඳිමින් දැඟලුවත් නිසි අවස්ථාව වන විට මදු ගසා පුස්සා කිරීම පමණක් නොව, හලාල් කිරීම දක්වා ගමන් කිරීමට රනිල් නොපසුබට වනු ඇත. මෙවැනි අවස්ථාවකදී අසරන වන ඔවුන් පසුපස ගෑටුනු අන්‍ය ජාතික බලවේග විදේශ උවමනාවන් අනුව හැසිරීමට ඉඩක් ඇත. එය වලක්වා ගැනීමට ඒකාබද්ධ විපක්ෂය පෙරමුණ ගත යුතුය.

## ශ්‍රී.ල.නි.ප. නිසි මගට

මහින්ද විරසකය තවදුරුටත් පවත්වා ගෙන යාමට ශ්‍රී ල.නි.ප. ඇතැම් පිරිස් කල්පනා කරනවා නම් එය ඔවුන් තමන්ගේ අතින් මරුවැල කරට දමා ගැනීමක් වනු ඇත. විශේෂයෙන් සිරිසේන ජනපති රනිල් විරෝධියෙක් ලෙස පෙනී සිටිමින් ජාතික නිදහස, ස්වාධීනත්වය, ස්වෛරීත්වය හා ජනවාර්ගික සංහිඳියාව වෙනුවෙන් නොපැකිල කටයුතු කිරීම නිසා ඔහු සමඟ යම් ඡන්ද පදනමක් අවසානය දක්වා රැඳී සිටිනු ඇත. එබැවින් ජනාධිපතිවරණයකදී එක් ඡන්දයක් වුවත් තීරණාත්මක වන බැවින් මහින්ද මහතා ඇතුලු ඒකාබද්ධ විපක්ෂය එය එකතු කර ගැනීම වෙනුවෙන් ඥානාන්විත විය යුතුය. පොහොට්ටුවේ තනිපංගලමේ වීරත්වය නොතකා මහින්ද එම අභියෝගය භාරගැනීම අවශ්‍යය. දැනට සිදු වෙමින් ඇත්තේ යූ.ඇන්.පි.යේ පරාජය පෙනී යන පමණට ජනාධිපතිවරණය නොපැවැත්වීම හෝ ඒ සඳහා වෙනත් මාවතක් සොයා බැලීම සිදුවිය හැකිය. එබැවින් රනිල් ඇතුලු යූ.ඇන්.පී. බලය පලවා හැර ජනතා ජයග්‍රහණයකට මඟ පාදා ගැනීම සඳහා පොදු ජන බලවේග එක් දෙසකට ගොනු කර ගැනීම සඳහා සිරිසේන ජනාධිපති පොදු ජන සුබසිද්ධිය වෙනුවෙන් අත්‍යාවශ්‍ය කැපකිරීම් සිදු කිරීමට සූදානම් විය යුතුය.

**සිරිසුමන විදානපතිරන**
2019-08-02

# 2020 ජනා

# ශ්‍රීලනිප, එජාප, පොජපෙ,

## අගමැති රනිල් ජෝන් ඩොයිලිගේ අවතාරයද?



පාර්ලිමේන්තු මන්ත්‍රී
පූජ්‍ය අතුරලියේ රතන හිමි

**හාමුදුරුවනේ ඉදිරි දේශපාලනය කොහොම වෙයිද?**

අගමැති රනිල් වික්‍රමසිංහලා ගේ දේශපාලනය රට වෙනුවෙන් වත් රටේ ජාතිකත්වය වෙනුවෙන්වත් , ජනතාව වෙනුවෙන්වත් නෙවෙයි. එහි ඇති අති භයානක විනාශකාරී තත්වය තමයි අදවෙනකොට දකින්න තියෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ ලෙස ගත්තාම ඒ අයත් බොරුවට අගමැති රනිල් වික්‍රමසිංහ පන්නමු කියලා සටන් පාඨ කියමින් එලියට එනවා. ඒවා අගමැති රනිල් වික්‍රමසිංහලට පක්ෂව සිදුවන සිදුවීම් කියලයි මට හිතෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ අගමැති රනිල් වික්‍රමසිංහට වඩා ප්‍රතිපත්ති වල ඇති භයානකකම දකින් නෑ, කියන් නෑ . නමුත් ඔවුන්ගේ න්‍යාය පත්‍රය අගමැති රනිල් වික්‍රමසිංහට පක්ෂවයි තියෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ ගන්න තීන්දු තීරණ ඒ ආකාරයෙනුයි ක්‍රියාත්මක වෙන්නේ.

**එතකොට ඔබ වහන්සේ හිතන්නේ මේ රට පාලනය කළ යුතුවන්නේ කවුරු කියලද?**

හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව හරි හොඳ ආණ්ඩුවක් කියලා මම හිතන්නේ නෑ. නමුත් අගමැති රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ප්‍රතිපත්තිවලට වඩා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ප්‍රතිපත්ති හොඳයි.

**ඒ කියන්නේ හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහත්තයා හොඳයි කියලද?**

එහෙම මත් නෙමෙයි. හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවේදී අපි ලොකු ගැටළුවට මුහුණ පෑවා. රවුන්ඩප් (වල්නාශක) වලට විරුද්ධව, රිෂාඩ් බදුර්දීන් කැලෑ එලිකරනකොට, කැසිනෝවලට විරුද්ධව, අප හෘද සාක්ෂියට එකඟව එළියට ආවට මේ ආණුඩු දෙක කිරලා මැනලා බැලූවිට අගමැති රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවට වඩා හිටපු ජනපති මහින්ද රාජපක්ෂලාගේ දේශපාලනය රට ගැන හිතන, ජාතික ව්‍යාපාරය පෝෂණය කරන, බර වැඩි පැත්ත තියෙන්නේ. අන්න ඒ ජාතික ව්‍යාපාරය හරහා බලගතු ව්‍යාපාර එක ගොන්නට ගෙනත් ජාතික ව්‍යාපාරය න්‍යාය පත්‍රය සැකසිය යුතු වෙනවා. අගමැති රනිල් වික්‍රමසිංහ මේ රටට ආදරය කරණ කෙනෙක් නොවෙයි. ඔහු ජෝන් ඩොයිලිගේ අවතාරය දැයි විටෙක හිතෙනවා. ජනතා විමුක්ති පෙරමුණ විසින් ඔහුගේ ක්‍රියාදාමයන්ට උදව්කරමින් තමයි යන්නේ. ඒ නිසා ඉදිරි ජනාධිපතිවරණයේ දී බලගතු මිනිසුන්ට වඩා රටට ආදරය කරන ජාතික ව්‍යාපාරය ශක්තිමත් කරන නායකයෙක් අපි ගේන්න ඕන.

## අපි ඕනෑම මැතිමවරණයකට සූදානම්

**පොදුජන පෙරමුණේ ඉදාරි මැතිවරණය ගැන සූදානම කොහොමද?**

තව මාස කීපයකින් අපේ ආණ්ඩුවක් පිහිටවනවා. මෙහෙම පිහිටවන ආණ්ඩුව තුළ මේ වන විටත් එහි ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සදා නිම කොට අවසානයි. මුලින්ම අපි මෙරටේ ප්‍රධාන කාරණා තුනක් ගැන අවධානය යොමු කොට තිබෙනවා.

පළමුවෙන්ම ජාතික ආරක්ෂාව, දෙවැන්න ආර්ථික සමෘද්ධිය, තුන් වැන්න තරුණ අපේක්ෂා, මේ සම්පාදන කාර්යයට මම සෘජුවම සම්බන්ධ වෙනවා.



පොදුජන පෙරමුණේ නිර්මාතෘ
බැසිල් රාජපක්ෂ මහතා

මෙවැනි කාරණයක් මතු කිරීමේ අවශ්‍යතාවය තියෙන්නේ මා දකින හැටියට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ගෙදර යවන්න සමහර සාමාන්‍ය කාරණා ඉවහල් වුනා. සුළු සුළු නීති රීති මේකට හරස් වුනා. මේවාට අකමැති වෙච්ච සමහරු ඡන්දය විරුද්ධව ප්‍රකාශ කළා. කහඉර නීතිය වගේ දේවල් උදාහරණ හැටියට දෙන්න පුළුවන්. ඒ වගේම අලෙවි මව්ලානා වැනි අය වෘත්තීය අත්පත්‍රිකා බෙදන කොට ඒ පත්‍රිකා තැන තැන විසිරීම මත පරිසර දූෂණය ඇතිවූ නිසා ඒකට නීතිය හවුල් වුනා කියලා පහුගිය ආණ්ඩුවට විරුද්ධව කථා කරන්න වුනා. ඉතිං මේවට නීති තිබිය යුතුයි. සාමාන්‍ය ජනතාවගේ පැත්තෙ තමයි නීති සැකසිය යුත්තේ. මානව හිමිකම් ආදිය තිබෙන්න ඕන. හැබැයි මෙහෙම නීතිය කියලා මාංචු දාලා චෝදනාකරුවන් කැළණි ගඟට පන්නන නීතිය නෙමෙයි අවශ්‍ය. පැය 24 කින් ඔවුන් අධිකරණයට පමුණුවලා නඩු විමසන ක්‍රමය මේ රටේ තියෙනවා. ඒ වගේ මිනිසු ඉන්න නීති පද්ධතියක් රටේ ක්‍රියාත්මක විය යුතුයි. තනි වචනයකින් කීවොත් මේ රටේ හැම කාර්යයකම අවසානය රටක් ලෙස අපි දැකිය යුත්තේ ප්‍රීතිමත් රටක් ලෙසයි. එම නිසා අපේ රජයක් නුදුරේම බිහිකරන්න සියළුම ක්‍රම සම්පාදන අපි හදලා ඉවරයි.

**එතකොට ජනාධිපතිවරණයට මුහුණ දෙන්නේ කොහොමද?**

එළඹෙන අගෝස්තු 11 වෙනිදා පොදුජන පෙරමුණේ මහා සමුළුවේදී මහින්ද රාජපක්ෂ මහතා විසින් සුදුසු ජනාධිපති අපේක්ෂකයා නම් කිරීමට නියමිතයි. ඒ වගේම පොදුජන පෙරමුණේ සභාපතිවරයා පවා එදිනට නම් කරයි. මේ වන විටත් ජනාධිපති අපේක්ෂකයෝ පස් දෙනෙක් පමණ යෝජනා වී තිබෙනවා. එයින් නිවැරදි අපේක්ෂකයා කව්දැයි හඳුනාගෙන විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශයට පත් කෙරුණ පසු අපි පොදුජන පෙරමුණ ලෙස ජයග්‍රාහී මාවතට ප්‍රවිශ්ඨ වෙනවා. හිටප ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපති සටනට වඩා වැඩි කැප කිරීමකින් අපේ අඩුපාඩු කම් පවා නිවැරදි කරගෙන ජයග්‍රාහී ලෙස ඉදිරියට යන්නට තමයි අපේ බලාපොරොත්තුව. ඒකට අවශ්‍ය සියළුම දේවල් මේ අවස්ථාවේදී පොදු ජන පෙරමුණ ලෙස ඉටුකර හමාරයි. ගමක් නගරයක් පාසා අපේ දේශපාලන ව්‍යාපාරය දියත් කොට හමාරයි. ඒ නිසා ජනාධිපතිවරණය පමණක් නොවෙයි මහාමැතිවරණයටත් අපි සූදානම්.

**කොහොමද ඉදිරි දේශපාලන සූදානම?**

අපි මේ අවස්ථාවේදී දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට, ආසනයක් ආසනයක් පාසා, ගමින් ගමට විධිමත් ආකාරයට ලංකාවේමෙ අපේ සංවිධාන ජාලය, පක්ෂයේ ශක්තිය වර්ධනය කරමින් තමයි යන්නේ. ලංකාවෙ ආසන 162 කම අපි ඒ නිසා ආවරණය කරනවා. ඒ වගේම අපේ කණ්ඩායම් විසින් නව සාමාජිකත්වයේ බඳවා ගැනීම් පැරණි සාමාජිකයන් ශක්තිමත් කිරීම් මේ තුළින් සිදුකරනවා.

**ඔබතුමාලගේ ජනාධිපති අපේක්ෂක ජනපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ද?**

අපේ ජනාධිපතිතුමා තවම කියලා නෑ ඉල්ලන් නෑ කියලා. නමුත් අපි වැඩ කරන්නේ එතුමා ඉල්ලනවා කියන බලාපොරොත්තුවෙන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපේ නායකයා දිනවීම තමයි අපේ අරමුණ.



පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම්

**ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තවම කියල නෑ කියන්නේ එතුමා ඉල්ලන්නෙ නෑ කියන එක නේද?**

නෑ එහෙම නෙවෙයි. එතුමා ඉල්ලන් නැත්නම්, අපේ විකල්පය අපි සොයාගත යුතුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපි සන්ධාන ගතවිය යුත්තේ කා සමගද? ජනාධිපතිවරණයේදී කුමන අපේක්ෂකයාටද උදව් කල යුත්තේ යන්න සොයා බැලිය යුතුයි. ඒ අනුව තමා අපි ජනාධිපතිවරණයට මුහුණ දෙන්නේ.

**ඔබතුමාලා පොදුජන පෙරමුණ සමග සාකච්ඡා කළා නේද? දැන් පොදුජන පෙරමුණේ අපේක්ෂකයා ගෝඨාභය රාජපක්ෂ නම්කොට තිබෙනවා නේද? ඔබකුමාල එතුමාට උදවුකරන්න බයද?**

අපොයි එහෙම නෙවෙයි. එතුමා අපේ හොඳ මිත්‍රයෙක්. ආරක්ෂක ලේකම් කාලයේ පවා අපි සමඟ හුඟක් සුහදයි. එතුමා සමඟ නිර්මාණශීලීව අපට වැඩකල හැකියි. අපට එහෙම ප්‍රශ්නයක් නෑ. අපට පොහොට්ටු එක්ක වැඩ කරන එක ගැටළුවක් නොවෙයි.




**එතකොට ඉදිරියේදි සූදානම් වියයුත්තේ ජනාධිපතිවරණයට ද?**

නෑ මුලින් තියෙන්නේ පළාත් සභා මැතිවරණය. අපි ජනාධිපතිතුමාට යෝජනා කරනවා මුලින් තිබිය යුතු පළාත් සභා මැතිවරණය තියන්න කියලා. එතකොට අපිට තීන්දුවක් ගන්න පුළුවන් මේ රට මොන මානයක තියෙනවා ද කියලා. පළාත් සභා ඡන්ද ජයග්‍රහණයේදී ඉදිරි ජනාධිපති අපේක්ෂකයා ජනතාව විසින් ම තෝරා ගනීවී.

## තම ආසනය පවා පැරදුන අයට ජනාධිපති අපේක්ෂක ධුර ලබාදීම එක්සත් ජාතික පක්ෂයේ ක්‍රමය නෙවෙයි

**ඉදිරි ජනාධිපතිවරණ අපේක්ෂකත්වය සදහා ඔබතුමාගේ එක්සත් ජාතික පක්ෂයේ අදහස කුමක්ද?**

ඉදිරි ජනාධිපතිවරණයට අපි පුළුල් දේශපාලන සංවිධානයක් බිහිකරන්නයි සූදානම. අපි සමග සිටින සියළුම කණ්ඩායම් ඒකාරාශි කරගෙන සමුළුවක් පවත්වා තමන් ජනාධිපති අපේක්ෂකයා පත් කරන්නේ. නුදුරේදී ම බලාපොරොත්තු වෙනවා එය සිදුකරන්න.

**එය සිදු කරන්නේ කවදාද?**

අගෝස්තු මාසයේ මුල් වකවානුව තළ තමා එහෙම කරන්න හිතාගෙ ඉන්නෙ.

**එතකොට කවුද අපේක්ෂකයා**

නම් තුනක් මේ වනවිට යෝජනා වෙලා තියෙනවා. නායක අගමැති රනිල් වික්‍රමසිංහ ,කථානායක කරූ ජයසූරිය, අමාත්‍ය සජිත් ප්‍රේමදාස, මේ සියළු

# ධිපතිවරණයේ

# ජවිපෙ, අපේක්ෂකයා කවුද?






අමාත්‍ය
ලක්ෂ්මන් කිරිඇල්ල

දෙනාගේම නම් කෘත්‍යාධිකාරි මණ්ඩලයට ඉදිරිපත් කරලා තීන්දුව අරගෙන අපේක්ෂකයා ඉදිරිපත් කරනවා.

එතකොට මේ තුන් දෙනාම පොදු අපේකෂකයින් හැටියට ඉදිරිපත් වුනත් ඔවුන් එක්සත් ජාතික පාක්ෂිකයින් හැටියට තමයි ඉදිරිපත් වෙන්නේ. සන්ධානගත උනත් අපෙ බලාපොරොත්තුව එක්සත් ජාතික පක්ෂයෙන් ජනාධිපති අපේක්ෂකයෙක් ගේන්නයි.

**ඔබේ පක්ෂ නායක අගමැති රනිල් වික්‍රමසිංහ මීට ප්‍රථම ජානාධිපතිවරණ දෙකකදී තරගකලේ නෑ නේද?**

ඔව්. නමුත් සුදුසු අවස්ථාවේ එතුමා තරඟයට ඒවි. නැතිනම් සුදුසු කෙනාට අවස්ථාව දෙයි. හැබැයි ආසනයවත්, දිස්ත්‍රික්කයවත් දිනා දෙන්න බැරි වුනු අයට එහෙම අපේක්ෂකත්වය දෙන්න බැරිවේවි.

මේ රටේ බිහිවුණු සියළු ජනාධිපතිවරු ඉදිරිපත් වුණේ තමන්ගේ ආසනයත් දිනාගෙන. ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස, චන්ද්‍රිකා බණ්ඩාරනායක, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරුන් ජයග්‍රහණය කලේ තමා ආසනය ජයග්‍රහණය කරමින්, තම බලය පෙන්වමින්. ප්‍රවීන දේශපාලන දහරාවේ ජයග්‍රහනය එවැනි අපේක්ෂකයින් රැදෙනවා විනා ආසන පැරදුන අයට දීම එතරම් සුදුසු නෑ.

**ඔබතුමා ජනාධිපතිවරණයට ඉල්ලන්න අදහසක් නැද්ද ?එතකොට ඔබතුමාගේ නෝනට ආර්යාව වශයෙන් ඉන්න පුළුවන් නේද?**

මගේ නෝනා ඔය ගෙදරට වෙලා අතවන වනා ඉන්න කෙනෙක් නෙවෙයි.ඇය නීතිඥවරියක්. අපි එක්සත් ජාතික පක්ෂය හැටියට හරිවෙලාවට අපේ අපේක්ෂකයා නම් කරන්නම්.

## ප්‍රහල ව්‍යාපාරිකයෙක් ජනාධිපති අපේක්ෂකයා වෙයිද?

**ගවේශනාත්මක මාධ්‍යවේදියෙකු ලෙස ඉදිරි ජනාධිපතිවරණයපිළිබඳව ඔබගේ දැක්ම කෙබදුද?**

ඉදිරි ජනපතිවරණයට තම පක්ෂය ඉදිරිපත්කරන අප්ක්ෂකයා තෝරාගැනීම ප්‍රධාන පක්ෂ වලට අන්තෝජටා බහීජටා ප්‍රශ්නයක් වෙලා. මේකෙන් අප තේරුම්ගතයුත්තේ කුමක්ද? මෙරට ජනතාව සිය නායකයා තෝරාගැනීමට හිමකමක් නොමැති බවයි. මෙරට ප්‍රධාන පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය වැඩවසම් සම්ප්‍රධායක් තුලයි තවමත් තියෙන්නේ. රටේ ජනතාවට මෙය සංවේදී මාතෘකාවක් නොවන්නේ දශක හතරක් පුරා අපේක්ෂා භංගත්වයට පත්වී සිටීම හා සියලු නායකයින් ජනතාවට දුන් පොරොන්දු කඩකිරීමයි. ජනතා විමුක්ති පෙරමුණු පොදු අපේක්ෂක සංකල්පය ප්‍රායෝගික නොවන හීනයක්. ඒ අයට දැන් පොදුඅපේක්ෂකයෙකු වෙනත් ග්‍රහලෝකයකින් ගෙනාවත් යථාර්ථයක් කරගන්න බෑ.

**ප්‍රබල ව්‍යාපාරිකයෙකු ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බව ප්‍රචාරක ව්‍යාපාතියක් දියත්වෙමින් පවතිනවා මේ පිළිබද ඔබේ අදහස කුමක්ද?**



ප්‍රවීන මාධ්‍යවේදී
ටිකිරි දිසානායක

මෙරට අංක එකේ ධන කුවේරයාවන ධම්මික පෙරේරා ජනාධිපති වරණයට ඉදිරිපත් වන බවට පසුගිය කාලය පුරාම, පුවත්පත් සම්මුඛ සාකච්ඡා ෆේස්බුක් සටහන් මගින්ද නොමේරූ තරුණ පරපුර විසින්ද අංගවිකල ප්‍රවෘති පලකර තිබුනා.

**ධම්මික පෙරේරාට ජනාධිපති දූරයට සුදුසුකම් නැද්ද?**

1980 දශකයේ වාද්දුව වෙරල තීරයේ ගාමිණී සොයිසා නැමති ව්‍යාපාරිකයාට තිබුණු සන්සෙට් කබානා හෝටලයේ බූරුවා පොලවල් පවත්වා ඒවායේ තෝන් එකතුකල බව ප්‍රකට කරුණකි. පිටකොටුවේ කැටතුනේ ඇන්කර් සූදුවත්, ජැක්පොට් සූදුවත් කරගන ගියබව නොරහසක්.

1992 දී රජයට අයත් මල්වත්ත වැලි වැවැලි සමාගම හේලිස් සමාගම විසින් 50 අවුරුදු බද්දකට ගත්තා. මේ මෑතකදී හේලීස් සමාගම ධම්මික පෙරේරා පසුකලෙක මිලදීගත් පසුව වැවිලි සමාගමත් ධම්මික සතුවිය. ඒ අනුව රජයේ වතු ඉඩම් අක්කර 25,000 ක් ධම්මිකට හිමිවිය.

1979 ජූනි මස රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් නුවරඑලිය ස්ක්‍රබ් වත්තෙන් (පීඩෘෆ) අක්කර 5ක් ගැසට් නිවේදනයක් මගින් දිසාපතිට පවරාගන එම ඉඩම් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පවරා ප්‍රදේශයේ ඉඩම් නොමැති පවුල් 68ක් සදහා පර්චස් 10 බැගින් බෙදා වෙන්කරලා ඔවුන්ගෙන් මුදල් ලබාගෙන සින්නක්කර ඔප්පුද නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලබාදී තිබියදී දැනට වසර 30 කට අධික කාලයක් ඔවුන්ට නිවාස මෙම ධනපති අපේක්ෂකයා සාදාගැනීමට ඉඩ නොදී බලහත්කාරයෙන් බුක්තිවිදිනවා.

මැනුම්පතිගේ MU/SG/29 -2018 පිඹුර ප්‍රකාර මෙකී වත්තෙන් හෙක්ටයාර් 674 රූඩ් 3ක් බදුගිවිසුමට පිටින් බදුමුදල් නොගෙවා ධම්මික පෙරේරා භුක්ති විදිනවා.

මේවනවිට ආන්දෝලනයට තුඩුදි ඇති කුණු කන්ටේනර් 1000ක ටොන් 27695ක් මෙරටට ගෙන්වා තිබෙනවා. ආයෝජන මංඩලය කියනවා මේ කුණු ගෙනාවේ හේලීස් ධම්මික පෙරේරාබව.

ධම්මික පෙරේරා 2013 දී ආයෝජන මංණ්ඩලයේ සභාපති ලෙස සිටියදී මේ කුණු ආනයනය සඳහා ගැසට් නිවේදනය නිකුත්කර තිබෙනවා. මේ වකවානුවේ ඔහු ප්‍රවාහන අමාත්‍යාන්ශයේ ලේකම්ද විය. අමාත්‍යාංශ ලේකම් දූරයක් දැරීමට ඔහුට ඇති සුදුසුකම් වුයේ කලුතර විද්‍යාලයේ මූලික අධ්‍යාපනයත් මොරටුව කාර්මික විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරීමක් පමණයි.

2013 අගොස්තු 01 ගම්පහ රතුපස්වල ධම්මික පෙරේරාට අයත් වෙනින්ග්‍රොස් රසායන කම්හලේ විශ අපජලය ලින් ජලයට මිශ්‍රවීමෙන් ජනතාව රෝගී වීමට එරෙහිව කල උද්ගොශනයට හමුදාව යොදවා වෙඩිතබා, මහපාරේ ගිය තරුණයෙකු ඇතුලු තිදෙනෙකු ගාතනය කරන ලද අතර තවත් 12 දෙනෙකු බරපතල තුවාලද, 8 දෙනෙකු සුළු තුවාල ලබා ඇත. තවත් 21 දෙනෙකු බැටන් ප්‍රහාරයන්ට ලක්වී රෝහල් ගතවීය . මෙම වෙඩිතැබීමට අණදුන් බ්‍රිගේඩියර් දේශප්‍රියට පසුව විදේශ තානාපතිකමක් ලබාදුන්නා. මේ අනුව පැහැදිලි වන්නේ ලංකා රාජ්‍ය එදා ව්‍යාපාරිකයන්ගේ ග්‍රහනයට හසුවූ ආකාරයයි.

**ධම්මික පෙරේරා ලංකාවේ ප්‍රමුඛ පොහොසතා වීමේ රහස කුමක්ද?**

ලොකු පිළිතුරක් දෙන්න ඔනි, නමුත් මම කෙටියෙන් කියන්නම්. මේ රටේ පාලනය ධනකුවේරයන්ට බාරදීම පිළිබදව කථාකරන අන්ධ ජන සමාජයට මට කීමට ඇත්තේ අවුරුදු 25ක් වැනි කෙටි කාලයකින් ලංකාවේ පලමු ධණකුවේරයා වූවේ කෙසේද? ප්‍රග්ධනය පිළිබදව කාල් මාක්ස්ගේ විග්‍රහයට අනුව අසීමිත ලෙස උපයන ලද ධනය හැදින්වූයේ හොරබඩු වලට කියන තවත් නමක් ලෙසය. ආශ්චර්යකින් හෝ ඔහු ජනාධිපති උවහොත් රටටත් ජනතාවටකත් අබ සරණයි.



**සාකඡාව - ජනබන්දු සේනානායක**

## ශක්තියට ආධාර කරන්න

මූල්‍ය දුෂ්කරතා අභිබවමින් ශක්තිය මාස්පතා ඔබවෙත එවීමට අපි වෙහෙසෙමු. ශක්තිය පුවත්පත පවත්වාගෙන යාම වෙනුවෙන් ඔබ ලබාදෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අපවෙත ලබාදෙන්න. ඔබගේ මුදල් වෙනුවෙන් රිසිට් පතක් නිකුත්කරනු ලැබේ. සියලු මුදල් පහත දැක්වෙන ආකාරයට එවන ලෙස ඉල්ලමු. මුදල් ඇණවුම් කුරුදුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි පරිදි එවන්න.

## අපගේ ශෝකය

**ප්‍රාජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ කැකිරාව සංවිධායක අත්තනවත්ත සහෝදරයා සදහටම අප අතරින් වෙන්විය.**

**නිට්ටඹුව ප්‍රාදේශිය සභා බපප්‍රදේශයේ සංවිධායකයෙකු වූ ඉරුගල් බණ්ඩාර සහෝදරයා පසුගිය දිනක අප අතරින් වෙන්විය.**

**ඇහැලියගොඩ ප්‍රදේශයේ මංජුල, ආනන්ද, ලලිතා යන සහෝදර සහෝදරියගේ මෑණියන් වූ නාකන්දල පුංචිනෝනා මහත්මිය පසුගියදා අභාවප්‍රාප්ත විය.**

**මෙම අභාවයන් පිලිබදව අපගේ ශෝකය.**

# ෂරියා නීතිය සිය ආත්මය කරගත් වහබ් අන්තවාදයේ පැටිකිරිය

**අප්‍රේල් 21දා පාස්කු ඉරුදින ප්‍රහාරයට සම්බන්ධ වී සිටි පිරිස් දෙස බැලීමේදී ඔවුන් පීඩිත පංතිකයින් නොවන පවතින සමාජ ආර්ථික පීඩනයට එරෙහිව සටන් කලවුන් නොවන බවය. මහාචාර්ය සුමනසිරි ලියනගේ කියන පරිදි සුළුජාතික පීඩනය පදනම් කරගත් බලවේග හා ස්ලාමීය ආගමික අරමුණු වෙනුවෙන් පෙනී සිටින අන්තවාදී අන්ධභක්තිකයින් පිරිසක් බව ඉතා පැහැදිලිය.**

## උම්මත්තක ගෝත්‍රිකයන්

අල්කයිඩා සංවිධානයටද අනුබද්ද අයි. එස්. අයි. එස්. (ISIS) හා තවුහිද් ජමාද් සංවිධාන මේ වන විට ගෝලීය මට්ටමේ ඉස්ලාම් අන්තවාදි විශ්ව රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටින්නේ උන්මත්තක ගෝත්‍රිකයින් පිරිසක් ලෙසිනි.

ආගම වෙනුවෙන් දිවිපිදීම ඉස්ලාමීය ආගමික මූලධර්මවල සදහන් කරුනු මත පදනම්ව වෙනත් ආගම් හා දර්ශනයන් පිලිගන්න සියල්ලන්ම විනාශ කල යුතුය යන්න ඔවුන්ගේ දර්ශනයයි. අල් කුරානයෙ තිබෙන කරුණු හදාරන අයෙකුට මෙවැනි අන්තවාදි සංවිධාන බිහිවීමට ආගමික මූලධර්මවල සඳහන් උදෘත හා ඒවාට දී තිබෙන අර්ථකතන බලපා ඇතිබව දැක ගත හැකිය.

ඕනෑම කෙනෙකුට ඕනෑම ආගමක් හෝ දර්ශනයක් තම ජීවිතය මෙහෙයවීම සඳහා තෝරාගත හැකිය. එහෙත් තමන්ගේ විශ්වාසය හැර අන් සියළු විශ්වාසයන් පිළිගන්නා පුද්ගලයන් විනාශ කලයුතු බවට ඇති මතවාදයට කුමන ආගමක් සම්බන්ධවේද, එය පිටුදැකිය යුතු අදහසකි.

## සාහසිකත්වයේ කඩුව සහ හෙල්ලය

නබීතුමාගේ නිගමනය අනුව ගිය අනුගාමිකයින් ඇරඹූ පිලිම, ප්‍රතිමා හා සංකේත විනාශ කිරීමේ ව්‍යාපාරය සමග ලක්‍ෂගනන් මිනිස් ජීවිත විනාශ කිරීමට ක්‍රියා කලහ.තම ආගම හැර අන් සියළු ආගම් මිත්‍යා දෘෂ්ඨික වන්නේය. මෙකී මතවාද මත පදනම්ව මැකාවෙන් (මක්කමින්) ඇරඹුන සහාසිකත්වය කඩුව හා හෙල්ලයද අමෝරාගෙන ආසියාව දෙසට වේගයෙන් සංක්‍රමණය විය. මහමත්තුමාගේ ප්‍රවාද පෙරටුකොට ගත් බව කියන ඉස්ලාම් සටන්කාමීන් සේද මාවතේ ඉදිරියට ගමන් ගත්තේ හමුවන සියළු ප්‍රතිමා විනාශ කරමින්, සියළු ජනවර්ග ඉස්ලාමයට හරවා ගනිමිනි. ඊට අකමැති වූ අන්‍ය ආගමිකයින්ගේ ගෙල කඩුවෙන් සිදලීමෙන්ය.

මහා ප්‍රවාහක් ලෙස පැතිරීගිය ඉස්ලාමීය ආක්‍රමන මොන්ගෝලියාව, ටිබෙටය පාමුල, මධ්‍යම ආසියාව, ඇෆ්ගනිස්ථානය හා චීනයේ මධ්‍යම ප්‍රදේශ දක්වාම කඩුවට යටත් ප්‍රදේශ බවට පත්විය. පණ බේරා ගැනීම සඳහා රජවරුන් ඉස්ලාම් ආගම වැළද ගැනීමේ ප්‍රථිපලය වුයේ රටේ ජනතාවද ඉස්ලාම් වැළද ගැනීමයි. ( මැලේසීයාව, ඉන්දුනීසියාව )

## කුරිරු ප්‍රහාරයන්ට යටතවීම

ඉස්ලාමීය කුරිරු ප්‍රහාර වලින් ඛේදනීය ඉරණමකට පත් වූ බෞද්ධ රාජ්‍යයක් වූයේ කාෂ්මීරයයි.අදටත් ඉන්දියාව හා පාකිස්ථානයට මැදිව කුරිරු ත්‍රස්ත ප්‍රහාරයන්ට ලක්වන කාෂ්මීරය සවුදි අරාබියේ ටයින් නගරයේ සිට හමුදාවක් රැගෙන එහි පැමිණි මහමුද්බීන් කාසිම්ට යටත් වූයේ ක්‍රි.ව. 711දීය.

## නාලන්දා විශ්ව විද්‍යාලය

එවකට කාෂ්මීරය බෞද්ධ නිකේතනයක් වී තිබිණි.කාෂ්මීරයේ තිබූ එක් බෞද්ධ විශ්ව විද්‍යාලයක් වූ නාලන්දා විශ්ව විද්‍යාලයේ පමණක් භික්‍ෂූන් වහන්සේලා 5000ක් අධ්‍යාපනය ලැබූ ලොව විශාලතම විශ්ව විද්‍යාලය විය. ඉන්දු නදිය තරණය කරමින් ඉස්ලාම් හමුදා සේනාංකයක් රැගෙන ආ "මුහමද් බින් කාසිම්" ගේ උමයාද් කාලිපේනයට කාෂ්මීරය යටත් කර ගැනින. එවකට අවකන් දේශය (සින්ද් ප්‍රදේශය) වර්තමානයේ ඇෆ්ගනිස්ථානය ඇතුළු බිම් ප්‍රදේශ යටත් කොට වෙහෙර විහාර ආරණ්‍යවල භාවනානුයෝගීව වැඩවිසූ බෞද්ධ හිමිවරුන් දහස් ගනනනින් පිටමංකොට බෞද්ධ විහාර ඉස්ලාම් පල්ලි බවට පත්කලහ. එවකට විනාශ කිරීමට නොහැකිව ඉතිරි වූ ලෝකයේ අති දැවැන්ත ශෛලමය බාමියන් බුද්ධ ප්‍රතිමා වලටද මෑතකදී ඔසාමා බිල්ලාඩන් නායකත්වය දුන් තලේබාන් ඇෆ්ගන් ගරිල්ලන් විසින් මෝටාර් බෝම්බ ප්‍රහාර එල්ල කර විනාශ කරද්දී ලොවම කම්පාවට පත්ව ඊට විරෝධය පලකරද්දීත් ආගමික අන්තවාදීන් සිය ප්‍රහාර නෙනවතවා කරන ලදී.

## කුරුස යුද්ධය

ඉන් සියවස් ගනනකට පසුවද අරාබි රටවල පැරණි ඓතිහාසික ප්‍රදේශවල තිබු පෞරාණික බෞද්ධ, කතෝලික පලරූ විනාශ කිරීම ආරම්භ විය. වසර හාර පන්සීයක් පුරාවට මෙය සිදුවිය. ඒ වන විට ක්‍රිස්තියානි දේව ප්‍රතිමා විනාශ කරද්දී තම වන්දනා භූමි ආරක්ෂා කරගන්නට ක්‍රිස්තියානි භක්තිකයින් යුරෝපයේ රජවරුන්ගේ පිහිට පැතීය.ක්‍රිස්තියානි ආගමික ස්ථාන රැකගන්නට යුරෝපයේ ක්‍රිස්තියානි හමුදා මැදපෙරදිගට පැමිණියේ කුරුසයද පෙරටු කොට ගෙනය.ඒ හමුදා ප්‍රකට වුයේ කුරුස හමුදා යනුවෙනි.ක්‍රිස්තියානි හමුදා හා මහමත්තුමාගේ අනුගාමිකයින් අතර ඇවිලුන සටන් ප්‍රකට වූයේ කුරුස යුද්ධ නමිනි.අද දක්වාම සිදු වන්නේ එදා සටන්වල නූතන පැතිකඩයි. එය ඉස්ලාමය හා මිශ්‍ර වූ සෞදි රජවරුන් විසින් පෝෂණය කල ප්‍රචන්ඩකාරී සහාසික මතවාදයකි. අන්‍ය ආගමික මත නොඉවසීම මානව අයිතීන් ගරු නොකිරීම නිරාගමික බවට එරෙහි වීම, ලෝකය තිබෙන්නේ වහබ්වාදීන් සඳහා බවටත් අනෙක් සියලු මතවාදයන් විනාශ ක්රිම දෙවියන්ගේ කැමැත්ත බවත් විශ්වාසකරණ ඔවුහු පෘතුවිය මත ඉස්ලාමීය රාජ්‍ය පද්ධතියක් බිහි කිරීම සඳහා සටන්වදිති. සෞදි අරාබිය වහාබ්වාදය ප්‍රචලිත කිරීම සඳහා ඩොලර් බිලියන ගනන් ලෝකයේ රටවල් වලට පොම්ප කරනු ලැබතබේ.

අයි.එස්.අයි.එස්. අනුගාමික ශ්‍රී ලංකාවේ තවුෆික් ජමාද් සංවිධිනය ලංකාවේ නැගෙනහිර පලාත ආක්‍රමනය කර ඇති ආකාරය හෙලිවන තොරතුරුවලින් පෙනේ. ඊජිප්තුව, ඉරානය, ලිබියාව, සිරියාව, මාලදිවයින, වැනිරටවල් ඉස්ලාමය අභිබවා වහබ්වාදය පෙරට පැමින තිබේ. කිසිදු සමාවකි නැති අනුකම්පා විරහිත ෂර්යා නීතිය ඔවුන්ගේ ආත්මයයි.

## ෂර්යා බංකු පද්ධතිය

මෙරට නැගෙනහිර වහාබ් මදාසා ආයතනවල ඉගැන්විම සෑදහා ඊජිප්තු,පකිස්ථාන් වහාබ් ගුරුවරු 600කට වැඩි පිරිසක් ලංකාවට පැමිණ සිටිති. ලංකාවේ ෂර්යා බැංකුකරණය ව්‍යාප්ත කිරීමට ලංකා ආණ්ඩුව අනුග්‍රහය ලබාදී ඇත. ලංකාවේ ෆිනෑස් සමාගම් අතර අල්ෆලාහ් මූල්‍ය ආයතනය ලොව හොදම සේවාවන් අතර දෙවැනි තැනට පත්ව තිබේ. ලංකාවේ පිහිටවා ඇති ෂර්යා බැංකු සංඛ්‍යාව 11කි. රක්ෂණ සමාගම් ගණන4 කි. කොටස් වෙළඳපල ෂර්යා ආයෝජකයින්ගේ නාම ලේඛනයක් එලි දක්වා ඇත.ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රවර්ධන මධ්‍යස්ථාන 4කි.

## රාජ්‍ය නිපුනතා ආයතන

සවුදි ආධාර මත මඩකලපුව ෂර්යා විශ්වවිද්‍යාලයට ඩොලර් මිලියන 3600ක වියදමින් ඉදිකෙරමින් පවතී. පසුගිය රජය මගින් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස එයට අවසර දී ඇත. 2013 වසරේදී මෙම විශ්ව විද්‍යාලය සඳහා මහවැලියට අයත් අක්කර 25ක රජයේ ඉඩමක් ලබා දී ඇත.මෙම විශ්ව විද්‍යාලයට 2013 අගෝස්තු මස 13 එවකට හිටපු නිපුණතා පුහුණු හා වෘත්තීය පුහුණු කටයුතු අමාත්‍ය ඩලස් අලහප්පෙරුමේ නියෝජ්‍ය අමාත්‍ය හිස්බුල්ලා විසින් නිපුණතා පුහුණු ආයතනයක් ලෙස මුල්ගල තබා ඇත.

## දිළිඳු තරුණියන් 300ක්

එමෙන්ම ඉරානයේ අන්තර්ජාතික අල්මුස්තාපා නැමති මූලධර්මවාදී විශ්ව විද්‍යාලයකට අනුබද්දව වතුකරයේ දිළිදු තරුණියන් 300ක්බදවා ගෙන පාඨමාලා ආරම්භ කර ඇත.කුරාණය, අරාබි භාෂාව ඉගැන්වීමත් එමගින් සිදුකෙරේ.මෙකී පාඨමාලාව පවත්වා තිබෙන්නේ නුවරඑලිය සරස්වති ජාතික පාසල,පස්සර රජයේ දෙමළ විදුහල,හපුතලේ රජයේ දෙමළ විදුහල හා බණ්ඩාරවෙල රජයේ දෙමළ විදුහල යන විදුහල්වලය. පාර්ලිමේන්තු මන්ත්‍රී අරවින්ද කුමාර් මෙහි පුරෝගාමියාය. වසර 10ක් සඳහා මෙම පාඨමාලාව පැවැත්වීමත් වසරකට සිසුන් 500ක් බැගින් වසර 10ය අවසන් වනවිට පුහුණුව ලැබුවත් 5000ක් ඉවත් වීමටද නියමිතය.

වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස ආරම්භ කල නැගෙනහිර ප්‍රනා ප්‍රදේශයේ පිහිටි ෂර්යා විශ්ව විද්‍යාලය අද වන විට මුස්ලිම් අන්තවාදී හා මූලධර්මවාදී ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්ව තිබේ. නැගෙනහිර ආණ්ඩුකාර හිස්බුල්ලා විසින් රු. කෝටි 1300 වැය කොට එහි සියයට 90%ක කොටස් සිය පවුලට ලබාගෙන ඇත.එහි සභාපති වනුයේ හිස්බුල්ලා හිටපු ආණ්ඩුකාරවරයාය.

## අක්කර 300ක හිමිකමක්

අමාත්‍ය රිෂාඩ් බදුර්දින්ටද තවුෆක් ජමාත් සංවිධානයට ආධාර උපකාර කලබවට චෝදනා එල්ල වී ඇත. ඔහු පසුගිය රජය යටතේ අවුරුදු 10ක්ද පවතින රජය යටතේ අවුරුදු 4ක්ද අමාත්‍ය දූර හොබවා ඇත. රජයේ අනාථ මඩමක හැදුනු ඔහු අක්කර 3000ක ඉඩම් හිමියෙකි.අප්‍රකට ධන සම්භාරයක හිමිකරුවෙකි.

මෙරට බෙහෙවින් ලිහිල් ආගමන විගමන ප්‍රථිපත්තියක් ඇතිරටක් ලෙස පිලිගැනේ. මද්‍රව්‍ය ජාවාරමට කේන්ද්‍රස්ථානයක් වුයේද, අන්තවාදී සංවිධානවල මෙරටට පැමිණීමට හා දිගුකලක් රැදීසිටීමට පහසුවී ඇත්තේද මේ හේතුවෙනි. අගමැතිවරයා ඉකුත් සතියේ ප්‍රකාශකලේ අරාබිරටින් මෙරටට පැමිණි වහබ් දේශකයින් 600කට පමණ ආපසු රටින් පිටවීයාමට නියෝග කරන බවයි

**සංවාදයකට වාචෘත ලිපියකි**
**ටිකිරි දිසානායක**




## කවි සිතුවිලි

### යහ - කම්බ හොරු

යහ පාලන පොත පෙරළා කෙබර බණ
ඩැහැගෙන පාලනය සිරිලක් මවගෙ පණ
වනසනු පිණිස උඩගෙඩි පරයනට දෙන
යු. ඇන්. පිය ඇති රටටම කරපු වින

රයිගමයයි - ගම්පලයයි දෙපැත් තේ
දක්කති දෙපැත්තට පාලක කරත් තේ
පොදු ජනයාට වැළදී උස්මුරුත් තේ
නවතින්නට ලගයි දොරකඩ කරත් තේ

හෙවනැලි බිය - හඳපානට පිම්මෙ බිරූ
දුශන - පගා ටෙන්ඩර මත ගැම්ම දැරූ
හත්මතු පරපුරට තරගෙට හම්බ කෙරූ
යහ පාලනේ අලි රෑනම කම්බ හොරූ

බලකාමයෙන් - හෙණ ගැහුවත් ජන යාට
බැදගන වෙස් මුහුණු ඇස්බැන්දුම් පාට
පාලනයකට සැරසෙන අන්තිස කූට
යු. ඇන්. පීය. බාරයි හෙට යම යාට

ලක්බිම නොදී පරයන් හට අගුල්ලා
ඔක්කොම පඩික්කම් ටික ඔය අගුල්ලා
එලවන්නට පළමු කෙවිටෙන් අපුල්ලා
යු. ඇන්. පීය දැන් මකබෑ වෙයල්ලා

**රණගල සමරසේකර**

### සත්‍ය ගවේෂණය

අනාගත මං පෙතේ
විවර කරති කුහුඹුවෝ
සිය ඉපැරණි කුහුඹු ගුල්
නැවත නැවතත්
හාරමින් පිරික්සමින්
ආ ගමන් මග
සන්ධිස්ථාන සොයා
වෙහෙසෙමින්
ඇප කැපවෙමින්

**මංගල විජේසිංහ**

# වැව්ලි ඇමති ආණ්ඩුවේ වරද පිළිගනී

පසුගිය 25 වන දින පාර්ලිමේන්තුවේ වාසුදේව සහෝදරයා විසින් අසනලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් වැවිලි ඇමතිවරයා ප්‍රකාශ කලේ කුඩා තේවතු සමිති ලණනකට පොහොර සහනාධාරය දී නොමැති බවයි. එයට හේතුව වුයේ ඔහු විසින් ඒ සදහා ඉල්ලන ලද රු මිලියන 65.55 ක අතිරේක ප්‍රාග්ධනය රජය විසින් ලබානොදුන් බව ඔහු පැවසීය.

එවිට වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයා විමසුවේ එසේනම් ආණ්ඩුව මේ පිළිබද කරනලද වරද පාපොච්චාරනයක් ලෙස සැලකිය යුතුබවය.

මෙසේ පොහොර නොලැබීම කුඩා තේවතු හිමියන්ගේ ආධායම ඒ පමනින් අඩුවන අතර, සමහරවිට පොහොර නොදැමීම නිසා අස්වැන්න අඩුවන බවය.

# ඇමරිකානු ආධිපත්‍යය එපා... අපේ නිදහසට අත නොතබව්

වාසුදේව නානායක්කාර

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් මිදී පූර්ණ ස්වාධීනත්වය ලබාගත් අප රටේ ස්වෛරීත්වයට එල්ල වී ඇති ලොකුම තර්ජනයට අද මුහුණ දෙමින් සිටිමු. යැංකි විකී හෙවත් රනිල් වික්‍රමසිංහ අත්පත් කර ගැනීමේ රහස් සේවා ගිවිසුම ( ACSA ඇක්සා) මගින් ඇමරිකානු මිලිටරි අංශ වලට ඕනෑම වෙලිවක රටට ඇතුලුවී අපගේ වරාය, ගුවන්තොටුපල හා ක1දවුරු හෝ ඔවුන් පිහිටුවන වෙනත් මධ්‍යස්ථාන පහසුකම් ප්‍රයෝජනයට ගත හැකිද සහස්‍ර අභියෝගතා සංස්ථාව හෙවත් MCC යටතේ ත්‍රිකුණාමලයේ සිට කොළඹ දක්වා අක්කර දොලොස් ලක්ෂය (මිලියන 1.2ක) බිම් තීරුවක් වසැ 200ක් සදහා ඔවුනට බදු ගත හැකිවනු ඇත.

කොළඹ හා කටුනායක වෙත ආනයනය කරන භාණ්ඩ ත්‍රිකුණාමලය හෝ ඉන් එපිට තිබෙන ඔවුන්ගේ අභස්යානා රැගත් යුද්ධ නෞකාවලට ප්‍රවාහනය කළ හැකි වේ. හමුදා තත්ව ගිවිසුම හෙවත් යෝජිත (SOFA – සෝෆා) ගිවිසුම යටතේ ඇමරිකන් හමුදාවට ගමන් බලපත්‍රයක් හා වීසා අනවශ්‍යය. තවද එම හමුදා හටයන්ට ආයුධ සහිතව ලංකාවේ ඕනෑම තැනකට ආගිය හැකිය. ඔවුන්ගේ ආනයනයන්ට රේගු පරීක්ෂණ නැත, රේගු බදු නැත. ඔවුන් මිනීමැරීම් හෝ බලහත්කාර දූෂණ වැනි අපරාධ සිදු කලත් ලංකාවේ නීතිය අනුව ඔවුන් අධිකරණයට පැමිණවිය නොහැකිය. වෙනත් අයුරකින් ලංකාව ඇමරිකානු එක්සත් ජනපදයේ ප්‍රාන්තයක් බවට පත්වේ. මේ අනුසාරයෙන් ඇමරිකානු යුද්ධ කඳවුරක් පිහිටවනවා වෙනුවට මුලු ලංකා භූමියම කිසිම වියදමක් නොමැතිව ඔවුන්ගේ යුද්ධ කඳවුරක් බවට පත්කර ගනී.

උදාහරණයකට චීනය වැනි රාජ්‍යයක් සමග ඔවුන් අනාගත ගැටුම් ඇති කර ගත හොත් අප ජනතානකන්ද වින්දිතයින් වනු ඇත. මෙම ගිවිසුම කෙසේ හෝ



නැවැත්විය යුතු බව මුළු මහත් ලංකික ජනතාව වෙත අමධාරණය කර සිටිමු.

# විදේශ රටවල් සමග රජය අත්සන්කල ගිවිසුම් වලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය

විදේශ රටවල් සමග රජය අත්සන් කරන ගිවිසුම් වලට පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුය. පාර්ලිමේන්තු යොජනාවක් ගෙන ඒමට ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගණනාවක් අත්සන් කර කතානායක වරයා විසින් මේ සම්බන්දයෙන් විවාදයක් පැවැත්වීමට එකගවී ඇතැයිද වාර්ථාවේ.

# සමෘද්ධි ඉල්ලූ අයට මැර ප්‍රහාර



නුවන් විදානගමගේ මහතා ප්‍රතිකාර ලබාගනිමින්

ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් බලප්‍රදේශය තුල අඩු ආධායම් ලාභීන්ට සමෘද්ධි සහනාධාර ලබාදීමට කටයුතු යොදා තිබුන නමුත් එම අය තේරීම තුල මහත් ගැටලු රාශියක් මතුවී තිබින. පස්දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් තුලින් මෙම අය තෝරාගැනීම සිදුවන බව මුලින් සඳහන් කලත් එය සිදුවී නොමැත.මෙම රජයට පක්ෂ පාතී අයට පමණක් සමෘද්ධිය ලබාදී ඇති බැවින් මෙයට විරෝධයපා ඇඹිලිපිටිය ප්‍රදේශීය සභා මනත්‍රී පොදුජන පෙරමුනේ නුවන් විදානගමගේ මහතාට එම විරෝධතා ව්‍යාපාරය ව්‍යාර්ථ කිරීමට පැමිනි මැරපිරිසක් පහරදීම් සිදුකලේයයි සඳහන් වේ. ඔහු දින දෙකක් ඇඹිලිපිටිය මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගන තිබුනි. පසුව සත්‍යග්‍රහයට සම්බන්ද වූ දෙදෙනෙකුට සමෘද්ධිය ලබාදීමට කටයුතු කර තිබුනත් අසාධාරණයට ලක්වූ අන් අය කිසිදු පිහිටක් රැකවරනයක් සිදුවී නැත.

එම නිසා ග්‍රාමනිලධාරී වසම් 48ක් පමන ඇති ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටින්නේ නිවැරදිව තෝරගෙන සුදුසු අයට පාට පක්ෂ බේදයකින් තොරව සමෘදි සහනය ලබාදෙන ලෙසයි.

**ඇඹිලිපිටියේ වාර්තාකරු**
**- ජයතිස්ස පතිරන.**

# උතුරු නැගෙනහිර සටන්කාමමීන් දකුනේ සමාජවාදීන්සමග

උතුරු නැගෙනහිර ප්‍රදේශවල පිවත්වන සටන්කාමී පක්ෂ කීපයක නායකයින් අධිරාජ්‍යවාදී මැදිහත්වීමට, දෙමළ ජාතික සංධානයේ පාවාදීමට, යු.ඇන්.පී.යේ. බෙදුම්වාදී ක්‍රියාමාර්ගයන්ට හා දක්ශිනාංශික මුස්ලිම් කොන්ග්‍රස් පක්ෂ දෙකට විරුද්ධව ඉදිරි මැතිවරණ වලදී ප්‍රතිපත්ති මුල් වූ එකගතාවයක් වෙනුවෙන් සමාජවාදී පෙරමුණේ කැදවීමක් අනුව පසුගිය 31 වනදා කොළඹ ආචාර්ය එන්.එම්. පෙරේරා මධ්‍යස්ථානයේදී රැස්විය.

මෙම කැදවීම වාසුදේව නානායක්කාර සහෝදරයා විසින් සිදුකල අතර එම සාකච්ඡාවෙන් අනතුරුව මහින්ද මහතාගේ නායකත්වයෙන් ඉදිරි ජනාධිපතිවරණයට ඉදිරිපත්වන අපේක්ෂකයා ජයග්‍රහනය කරවීම සඳහා ඔවුන් එකගතාව ප්‍රකාශකර ඇත.

ඒ පිලිබදව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මුනගැසීම අගෝස්තු 5 වනදා සවස සිදුවිය. මෙහිදී වැදගත් තීරන රැසකට එලඹිනි. එම සාකච්ඡාවට සමාජවාදී පෙරමුනේ නියෝජිතයන්ද, උතුරු නැගෙනහිර සටන්කාමී නියොජිතයන් ලෙස ඩග්ලස් දේවානන්ද (පා.ම), වර්ධරාජා පෙරුමාල් (හිටපු මහ ඇමති), ප්‍රභා ගනේෂන් (හිටපු නියොජ්‍ය ඇමති), ආචාර්ය විග්නේශ්වරන්, උයදරාසා - ශ්‍රීටෙලෝ, අරුන් තම්බිමුත්තු යන අය එක්විය.

# විදුලි මාෆියාව කෝටි ගණනින් ගසාකයි

ධම්මික සංජීව සහෝදරයා




ධම්මික සංජීව සහෝදරයා අදහස් දක්වමමින්

2015 සිට මේ දක්වා විදුලි ජනනය සඳහා යෙදිය යුතු ක්‍රියාමාර්ග අතපසු කරමින් හා පමා කරමින් විදුලිබල මණ්ඩලයේ පාලක පිරිස් මෙම ජාවාරම කලක සිට සිදු කරන බව විදුලිය පාවිච්චි කරන්නන්ගේ සංගමයේ කැදවුම්කරු ධම්මික සංජීව මහතා පසුගිය දිනක ගාල්ලේ පැවති මහජන හමුවේදී ප්‍රකාශ කර ඇත.

අඩුවියදම් බලාගාරයකින් රු 18 කට මිලදි ගතහැකි විදුලි ඒකකයක් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව හදිසි මිලදී ගැනීම් යටතේ එක් ඒකකයක් රු 43 වැනි ඉහල මිලකට මිලදී ගැනීම මෙහිදී සිදුවේ. මේ සදහා ඇමතිවරයා මැදිහත් වෙමින් තුර්කියේ සිට විදුලි ජනන යන්ත්‍ර සහිත නැවක්ද මෙරට ආසන්න මුහුදේ රදවා තබා ගැනීමෙන් මෙම ජනතා විරෝධී ගනුදෙනුව සිදුකෙරේ. එයට බලපෑමක් සිදුවන සියළු අනපනත් වෙනස් කිරීමටද විදුලිබල ඇමතිවරයා මේ වනවිට කටයුතු කරන බව ධම්මික සහෝදරයා වැඩිදුරටත් පෙන්වා දුනුනේය.

එපමනක්ද නොව විදුලිය තැම්පතු සදහා 5% අවම පොළියක් ගෙවියයුතු බවට විදුලිබල පනතේ දක්වා ඇතත් රුපියල් කෝටි 1000ක් පමන ඇප තැම්පතු සඳහා මෙතෙක් පොලී ගණනය කර නැත. එය නීත්‍යානුකූල කිරීම සදහා වර්තමාන විදුලිබල ඇමතිවරයා පනත සංශෝධනය කර එම වගන්ති ඉවත් කිරීමට සැරසෙන බවද ප්‍රකාශ විය.

විදුලිබල මාෆියාව දූෂිතයින් රැනක් අතට පත්වී ඇති අතර එයට ඇතැම් නිලධාරීන්, ඉංජිනේරුවන්, ඇමතිවරයා ඇතුලු දේශපාලන කොමිස් කාක්කන්ද එක්වී ජනතාවගේ මුදල් ගසාකන මගෝඩි ව්‍යාපාරයක් බවට පත් වෙමින් ඇති බව ධම්මික මහතා පෙන්වා දුන්නේය. එබැවින් මෙම උද්ඝෝෂණය රටපුරා ගෙනයමින් ජනතාව විරෝධතාවයට පෙලගැස්වීමට කටයුතු කරනබවද ඒ මහතා පැවසීය.

ශක්තිය

පෞද්ගලික විශ්ව විද්‍යාල
ඇති කිරීම සඳහා ආණ්ඩුව ඉදිරිපත් කරන
උසස් අධ්‍යාපන තත්ව සහතික
තේරීමේ හා ප්‍රතීතන කොමිෂන් සභා පනත
පරාජය කිරීමට අන්තර් වි.වි. බලමණ්ඩලය පෙරමුණේ.

# ඇමරිකානු හමුදා කැඳවන රහස් ගිවිසුම් කටුගා ඉරාදමව්

## • ගිවිසුම් රහසිගත ඇයි ? • අත්සන් කල ACSA ගිවිසුම කෝ ?

# ගිවිසුම් කොන්දේසි හෙළිකරනු




සමාජවාදී ජනතා පෙරමුනට අයත් පක්ෂ සහ මහජන එක්සත් පෙරමුණ ඇතුළු තවත් ප්‍රගතිශීලී පක්ෂ කිහිපයක් එකතුවී එකම තේමාවක් අනුව ජූලි 23 දින පස්වරුවේ කොටුව දුම්රියපොල අසල පැවැත්වූ සාර්ථක උද්ඝෝෂනය කරනකොට ගෙන අධිරාජ්‍යවාදීන්ගේ ආක්‍රමණීක ගිවිසුම් වලට වෙරෙහි ජනතා විරෝධය තවත් උණුසුම් වන බවට පුවත්පත් වාර්ථාකරුවන් පැවසීය.

දුම්රියපොල අසල පදික වෙළදාමේ නියුතු පිරසක්ද, දුම්රියපොල අසල ඇවිදිමින් වෙළදාම් කරන කිහිප දෙනෙක්ද විරෝධතාවයට සහයෝගය දක්වනු දැකිය හැකිවිය. විරෝධතාකරුවන් අතරින් කොටසක් ඇමරිකානු ආක්‍රමනය නවතා ශ්‍රී ලංකාවෙන් වහා පිටවෙයවු යන පත්‍රිකාව දුම්රිය මගීන් අතර බෙදනු දක්නට ලැබින. පැයක් පමන විරෝධය දැක්වීමෙන් පසුව විරෝධතාකරුවන් අමතා පක්ෂ නායකයෝ මෙම ගිවිසුම් නිසා ලංකාව මුහුනදී සිටින භයානක තත්වය ගැන කරුණු පැහැදිලි කලහ.

විරෝධතාවයේ සංවිධායකයන් ප්‍රකාශ කලේ දැනටමත් අත්සන් කර ඇති ACSA ගිවිසුමෙන් සාකෂාවට භාජනය වෙමින් ඇති SOFA ගිවිසුමෙන්, MCC ගිවිසුමත් නිසා ලංකාව තුල ඇමරිකානු එක්සත් ජනපද රාජ්‍ය බලයක් ගොඩනැගෙන බවත් ලංකාවේ සෛවරීත්වයට එනිසා හානිවී ගොස් ඇමරිකානු හමුදාවන්ගේ බලපෑම්වලට ලංකාවේ මැතිවරණ පවා නොපැවැත්විය හැකි බවය.

අත්සන් කල ACSA ගිවිසුම තවම පාර්ලිමේන්තුවට පවා හෙළිකර නොමැත. එහි පිටපතක් පාර්ලිමේන්තුවේ සභාගත කලේ විමල් වීරවංශ සහෝදරයාය. ජාතික මැතිවරණයකට පෙර මෙම ගිවිසුම් අටවා ගැනීමට ඇති කඩිමුඩිය නිසාම මෙම සැකය සනාථවන බවද ඔවුන් පැවසුවේය.

# ප්‍ර.වා.පෙ. හා ප්‍ර.ජා.කො. ප්‍රතිපත්ති සංධානයක





වාසුදේව සහෝදරයා නායකත්වය දරන ප්‍ර.ව.පෙ. හා හිටපු නියොජ්‍ය ඇමතිවරයෙක් වූ ප්‍රභා ගනේෂන් මැතිතුමා නායකත්වය දරන ප්‍රජාතන්ත්‍රවාදී ජනතා කොන්ග්‍රසය එක්වී ඉකුත්දා ඉදිරියේදී මතුවන මැතිවරණ ව්‍යාපාරයට මැදිහත්වීම සඳහා ප්‍රතිපත්තිමය අවබෝධයක් ඇති කරගෙන ඇත.

මේ පිලිබඳ පසුගිය 1 වනදා කොල්ලුපිටිය කැෆ්රි ශාලාවේ පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවේ දී නායකයන් දෙපල තම අදහස් සිංහල හා දෙමළ භාෂාවලින් ප්‍රකාශකරන ලදි. ඉන් අනතුරුව අවබෝධතා ගිවිසුමද, සංයුක්ත වැඩපිලිවෙලද මැතිවරණ කොමිසමේ සභාපති තුමා මුනගැසී බාරදී ඇත.